# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2334/38 - 2023 ජුනි මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2023.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ වූ දැන්වීම

*මගේ අංකය* : කොප්‍රාලේ/ඉඅත්/3/115/අමාත්‍ය මණ්ඩල කාර්යාලය.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/13/2020/සීඕ/172.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොටුව (කොළඹ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක 10026 හා 2022.12.30 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0845 ක පමණ වපසරියකින් යුතු වන වරිපනම් අංක 15, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ පිහිටි ඉඩම.

01. කැබලි අංක 01
**වරිපනම් අංක 15**

ඉඩමේ නම: වරිපනම් අංක 15, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ පිහිටි ඉඩම; හිමිකම් කියන්නා: රජය; වර්තමාන පරිහරණය: ගෙවත්ත සත් මහල් (භූගත මහල් සමඟ) ගොඩනැගිල්ලක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0845.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2023 ජුනි 20 වැනි දින පෙරවරු 10.00 ට කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2023 ජුනි 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

නාලක රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2023 මාර්තු මස 31 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0002


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*